**වැලිමඩ ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 06 දින සභාවේ ලේකම් වෙත යවා ඇත.

### 1.2 මතය

------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලටඅනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී සභාවට ලැබී තිබූ රථවාහන 05 ක වටිනාකම රු.16,985,047 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ දී සභාවට ලැබී තිබූ ගැල්වනයිස් කොඩි කණු 69 ක රු.68,208 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.16,055 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

(ඈ) කර්මාන්ත ණයහිමි වටිනාකම රු.1,700,113 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ප්‍රවර්තන වර්ෂයේ දී දරන ලද රු.589,200 ක් වටිනා වියදම් 12 ක් ප්‍රවර්තන වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුලදී දරන ලද රු.186,562 ක් වටිනා වියදම් විෂයන් 25 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

(උ) අවසාන තොග වටිනාකම රු.360,740 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) ඉකුත් වර්ෂ වෙනුවෙන් ලද රු.39,400 ක මුද්දර ගාස්තු ආදායම හා රු.7,699,827 ක උසාවි දඩ සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(එ) මළාපවාහන ව්‍යාපෘතිය යටතේ ලද පරිගණක යන්ත්‍රයේ වටිනාකම වූ රු.77,500 ක් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

----------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව ශේෂය හා බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව මුදල් ශේෂය රු.33,001 කින් නොසැසඳුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 44,618,773 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.58,407,907 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

රු.2,489,220 ක් වටිනා ගිණුම් විෂයයන් 04 ක්, ශේෂ තහවුරු කිරීම සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

----------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 වගන්තිය | වර්ෂයකට වරක් ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු. රෙ. 371 | අවස්ථා 32 කදී විවිධ පාර්ශ්වයන් වෙත ගෙවන ලද රු.2,319,133 ක අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (ii) මු.රෙ. 571 | කල් ඉකුත් වූ එකතුව රු.2,182,737 ක් වටිනා තැන්පත් 43 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තිය | සේවය හැරගිය හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන්දෙදෙනෙකුගෙන් සභාවට අයවිය යුතු එකතුව රු.220,454 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක 14 ක් හා ඊට අදාල උපාංග වෙනුවෙන් ලේඛනයක් නඩත්තු කොට නොතිබුණි. |

| (ඉ) | | |
|---|---|---|
| | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2012 ජූලි 03 දිනැති අංක SEC-2012/03 දරන චක්‍රලේඛය | නිවැරදි පරිදි අගය එකතු කිරීමේ බදු (VAT) ගෙවීම් ගණනය නොකිරීම හේතුවෙන් 2015 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා මාස තුල රු.128,823 දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණ කර තිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.22,651,504 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.26,007,502 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

---------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-------------------------------------

ඉකුත් වර්ෂයන්ට අදාලව සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී පැවැති හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

2.2.2 **බදු කුලී**

---------

(අ) කඩ කාමර 23 කට අදාලව මාස 6 ත් - මාස 166 ත් අතර කාලයක් හිඟව පවතින කඩ කුලිය රු.1,171,199 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයට අදාල 2015 දෙසැම්බර් 31 දක්වා හිඟව පවතින ටෙන්ඩර් කඩ කුලී රු.1,741,909 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.11,895,445 ක් සහ මුද්දර ගාස්තු රු.9,335,300 ක් අයවිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලය තුල ප්‍රතිපූර්ණය කරගත යුතුව තිබූ රු.1,700,352 ක වැටුප් හා රු.156,500 ක මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ ප්‍රජා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ලබාදී ඇති රු.1,000,000 ක මුදලක් යෝජිත කර්මාන්ත ක්‍රියාත්මක නොකිරීම නිසා 2016 මාර්තු 28 නැවත ප්‍රේෂණය කර තිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

4.1 **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ දී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණි.

4.2 **වාර්ෂිකප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

2015 වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

ප්‍රවර්තන වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

4.5 **වත්කම් කළමනාකරණය**

**නිෂ්කාර්ය වත්කම්**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් 1993 වර්ෂයේ මිලදී ගත් රු.138,650 ක් වූ ත්‍රිරෝද රථයක්නිෂ්කාර්යව පැවතුණි.

(ආ) සභාවට අයත් කැප්පෙටිපොල උප කාර්යාලයෙහි අත් ට්‍රැක්ටර් 02, ජල බවුසරයක්, ට්‍රැක්ටරයක්, ගිනි නිවීමේ රථයක්, ට්‍රැක්ටර් ට්‍රේලරයක් හා නඟුලක් දීර්ග කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා සභාවට අයත් උප කාර්යාලවල දෛනිකව රැස්කරන ලද රු.85,740,281 ක් මාසිකව ප්‍රධාන ගිණුමට මාරු නොකර නිෂ්කාර්යව වර්ෂය පුරා තැන්පත් කර තබා ගැනීම හේතුවෙන් ආදායම ආයෝජනය කිරීමෙන් උපයාගත හැකිව තිබූ පොලී ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

6. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) ණය ගැති සහ ණයහිමි පාලනය
(ඈ) වත්කම් කළමනාකරණය